


මෙපුර වසන්නෝ වාසනාවන්තයෝය. සාපෙක්ෂ ලෙස මනා පහසුකම් හා සැප සම්පත් විඳිමින් ජීවත්වීමම වාසනාවක් නොවේද? මෙසේ මෙපුර සැප විඳිමින් ජීවත් වන අපට අපේ මව්බිම එතරම් දුරස් බවක් නෙදැනේ. සතියේ දින පහක්ම රාජකාරි ස්ථානයේත් දින දෙකක් ස්ව නිවෙස් තුළත් කිසියම් කාලසටහනකට අවඅවේකීව වැඩ කිරීමට සිදුව ඇති අපට මානසික සුවය සිත්සේ විඳීමට අවස්ථා එමට මෙල්බර්න් පුරයේ තිබීමද වාසනාවකි.
ගතින් මෙපුර ජීවත් වුණත් සිත්න් තවමත් ලංකාවේ ජීවත් වන අපට සිංහල සංස්කෘතික ප්‍රසංගයක් සංගීත ප්‍රසංගයක් නර්තන ප්‍රසංගයක් වේදිකා නාට්‍යයක් සිංහල ටෙලි නාට්‍යයක් හෝ අඩුම වශයෙන් සිංහල ප්‍රවෘත්ති පත්‍රයක් සිංහල ගුවන්විදුලි වැඩ සටහනක් නොබලා නොඅසා සිටීම අති දුෂ්කරය.

මේ ඉහතින් සඳහන් කරුන ලද මාධ්‍ය සියල්ලම අපට ඉතාමත් සමීපය. අප ලංකාවේ සිටියදී වුවද නැරඹීමට අවස්තාවක් නොලැබෙන බොහෝ නිර්මාණ නැරඹීමේ හැකියාව මෙපුරදී අපට ලැබෙන බව මේ පිළිබඳව අධ්‍යයනයක යෙදෙන ඕනෑම අයෙකුට දැකිය හැකිය.

ශ්‍රී ලාංකික ජනගහනය අතින් බැලුවද ඕස්ට්‍රේලියාවේ වික්ටෝරියා ප්‍රාන්තයට හිමිවන්නේ විශේෂ ස්ථානයකි. ඒ ශ්‍රී ලංකාවෙන් පිටත වැඩිම ලාංකික ජනගහනයක් ජීවත්වන ප්‍රාන්තය වික්ටෝරියාව වීමය. සංඛ්‍යා ලේඛණ වලට අනුව මෙම ප්‍රාන්තයේ වෙසෙන ශ්‍රී ලාංකිකයන්ගේ සංඛ්‍යාව එක්ලක්ෂ විසි දහස ඉක්මවයි. මීට වසර 40කට හෝ 45කට පමණ පෙර මෙල්බන් නගරයේ කුමන අස්සක් මුල්ලක් නෑර සැරිසැරුවත් දැක ගත හැකිව තිබුණේ ඉතාමත් අඩු ශ්‍රී ලාංකිකයන් ගණනක් බව අපි දනිමු.

මෙම තත්ත්වය කෙමෙන් කෙමෙන් පහව ශ්‍රී ලාංකකයින්ගේ මේ පුර සංක්‍රමණය විමේ ප්‍රවනතාවය ඉතාමත් සීඝ්‍ර ලෙස, පසුගිය දශක හතරක කාලය තුල වැඩි වී ඇත. මෙරට ජීවත් වුවද, අපේ සිතුම් පැතුම්, කෑම බිම, ආචාර සමාචාර, සංස්කෘතික අංගයන් කෙරේ ඇති ඇල්මේ අඩුවක් නම් දැක ගන්නට නැත. ඒ අප ඒ තරමටම අප මව්බිම හා ඇති බැඳිම ශක්තිමත් නිසාය.

මේ වැඩිවන ශ්‍රී ලාංකික ජනගහනයට අවශ්‍ය ද්‍රව්‍ය මෙන්ම සේවා සපයන්නට සේවා ස්ථාණද ආගම දහම ඇදහීමේ පහසුව උදේසා ආගමික ස්ථානද ඇති කිරිම තුලින් ශ්‍රී ලාංකික අපට පමණක් නොව මෙරට වාසී අනෙකුත් ඕස්ට්‍රේලියානුවන්ටද සිදුවන මෙහෙය මහත්ය.

ක්‍රම ක්‍රමයෙන් වැඩිවන මේ අපේ ජනගහනයේ අව්‍යථා වෙනුවෙන් මෙපුර පැවැත්වෙන ප්‍රසංග සංඛාවද වැඩි වෙමින් පවතී. මුල් කාලයේදී වසරකට එක් සංගීත ප්‍රසංගයක්, එක් සිනමා නිර්මාණයක් පමණක් ප්‍රදර්ශනය වුවද, දැන් සති අන්තයේ සෙනසුරාදා හා ඉරිදා දිනවල ශ්‍රී ලාංකික ප්‍රසංගයක් නොපැවැත්වෙන ස්ථාණයක් සොයා ගැනීමද අති දුෂ්කරය. මෑත කාලයේ මෙම තත්වය තිව්‍රකරමින් සත් අන්තයේ දින දෙක තුල



# ප්‍රසංග වසන්තය

එකම වෙලාවක සංදර්ශන දෙකක් හෝ ඊටත් වැඩි සංඛ්‍යාවක් ප්‍රදර්ශනය විම විශේෂත්වයකි.

මේ කුම ප්‍රසංගයක් පැවැත්වුවත් ප්‍රේක්ෂයින්ගේ සහභාගිත්වයෙන් නම් සතුටු දායක මට්ටමක පැවතුනු බව මෑන කාලයේ පැවැත් වූ ප්‍රසංග දෙස බැලිමේදි පෙනි යන කරුණක්.එකල මෙන් නොව මෙකල ඇති මේ තරඟකාරිත්වය නිසා ප්‍රසංගවල ඇති උසස් මට්ටම රදවා ගැනිමට ප්‍රසංග සංවිධායකවරුන් දක්වන උනන්දුව නම් ප්‍රසංසනීයයි.

මා මුලින් සඳහන් කල තරඟකාරිත්වය තුල ප්‍රේක්ෂකයන් තමන්ගේ සංදර්ශනයට ආකර්ශනය කරවීම උදෙසා නොයෙක් ප්‍රයෝග කෙරෙහි යොමු විමද දැන් දැන් දක්නට ඇත.

එක් දිනක, සති අන්තයක හෝ සමහරවිට මාසයක පැවැත්වෙන ප්‍රසංග කිහිපයකට සහභාගි වීම කාලය පැත්තෙන් බැලුවද, ආර්ථික පැත්තෙන් බැලුවද කෙනෙකුට දුෂ්කර කාර්යයක් . මේ නිසා, ප්‍රදර්ශනයට නියමිත ප්‍රසංගවල සවභාවය ගැන සොය බලා තමා වඩාත් ප්‍රියකරන විශේෂ ආකර්ශනක් ඇති ප්‍රසංගයකට පමණක් සහභාගිවීමට යමෙකුට සිදු වේ.

සංගීත ප්‍රසංගයක් උදාහරණයකට ගතහොත් ගායන ශිල්පිය ගීත ගායනයට පමණක් සීමා නොවී. ගීතය ගැන. ගීතයේ විකාශය ගැන සඳහන් කරමින් කිසියම් ආකාරයක ශිල්පියා, ප්‍රේක්ෂකයා හෝ රසිකයා සමග සංවාදයක යෙදිමෙන් ප්‍රේක්ෂක ආකර්ශනය දිනාගනිම එවැනි ප්‍රයෝගයක් ලෙෂ සඳහන් කල හැක. මීට අමතරව නර්තන අංග, රූප රචනා යොදා පැවැත්වූ ප්‍රසංගයද අපට පසුගිය කාලයේ දැක ගැනිමට හැකි විය.

මෑතකදී මෙල්බර්න් නුවර පැවැත් වූ සංගීත් නිපුන්. මහාචාර්ය සනත් නන්දසිරි හා මල්කාන්ති කන්දරසිරි යුවල සහභාගි වූ ''සිත රෑ වසන්තේ'' සංගීත ප්‍රසංගයට එකතු කර තිබූ නර්තන අංග දෙකක් කෙරෙහි බොහෝ දෙනෙකුගේ අවධානය යොමු විය. මෙපුරට තරමක් ආගන්තුක වූ ''ප්‍රවාහ'' නර්තන කණ්ඩායට ඉදිරිපත් කල මෙම දර්ශන වලට වෙනදා අපි නර්තනයක නොදැකින වෙනස්ම මානයක් එකතු කිරිමට එස්.එල්.එම්. රෂාන් ප්‍රමුක නර්තන කණ්ඩායම සමත් වූ බව නම් නොකියාම බැරිය. ප්‍රසංග සංවිධාකයකයින් මින් ඉදිරියට ගෙන ඒමට බලාපොරොත්තු වන ප්‍රසංග උදෙසා තවත් අළුත් ප්‍රයෝග හඳුන්වා දිම වැදගත්ය.

## දයා බමුණුසිංහ හියුම් සිටි කවුසිලයේ උප නගරාධිපති පදවිය ලබයි

හියුම් සිටි කවුන්සිලයේ නාගරික මන්ත්‍රී දයාසෝම බමුණුසිංහ මහතා පසුගිය දා එහි උප නගරාධිපති ධුරයට පත්විය. ඒ සඳහා පැවති ඡන්ද විමසීමේදී නගර සභිකයන් වැඩි දෙනෙකුගේ විශ්වාසය දිනාගන්නට ඒ මහතාට හැකිවිය.

මෙල්බන් ශ්‍රී ලාංකික සමාජයේ ක්‍රියාකාරිකයකු ලෙස ගෞරවය දිනා සිටින දයාසෝම බමුණුසිංහ මහතාට සන්නසේ සුබ පැතුම් මෙසේ පිරිනැමෙයි.

